# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,301 - 2022 ඔක්තෝබර් මස 07 වැනි සිකුරාදා - 2022.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1618 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.-* (i) එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 ඔක්තෝබර් මස 28 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ඔක්තෝබර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1617 - B 082390— 5,403 (2022/10)
F 1 -

# පළාත් සභා නිවේදන

## මධ්‍යම පළාත් සභාව - ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා සුදුසුකම් ලත් ගරාජ අනුමත කිරීම - 2023 වර්ෂය

මධ්‍යම පළාත තුළ ලියාපදිංචි කර ඇති වෙළඳ වාහන සඳහා 2023 වර්ෂයට යෝග්‍යතා සහතික නිකුත් කිරීමේ කාර්ය ඉටු කිරීම පිණිස ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචි වී ඇති සහ අදළ බදු ගෙවීම් පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ හැකි ගරාජ හිමියන්ගෙන් හා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් ඩිපෝවලින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම අනුමැතිය ලබා දීම සඳහා සලකා බලනු ලබන්නේ මධ්‍යම පළාත තුළ පිහිටා ඇති ගරාජ පමණි.

01. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

පහසුකම් :-

(අ) අඩි 20ක් දිග අඩි 2 1/2 ක් පළල අඩි 4 1/2ක් ගැඹුරැති වාහන පරීක්ෂා කිරීමේ වලක් හෝ සමාන පහසුකම් සැපයෙන පරීක්ෂණ වේදිකාවක් හෝ ඔසවනයක්
(ආ) තිරිංග පරීක්ෂා කිරීමේ උපකරණ.
(ඇ) ප්‍රධාන ලාම්පු පරීක්ෂා කිරීමේ උපකරණ.
(ඈ) වාහනයේ යට කොටස, සුක්කානම් සන්ධි, තිරිංග, කේබල් ආදිය සහ දිරාගිය කොටස් පරීක්ෂා කිරීමට උපයෝගී කර ගනු ලබන ඉස්කුරුප්පු නියන් ද, ස්පැනර්, මිටි ආදී යාන්ත්‍රික මෙවලම්.

ii. සේවක මණ්ඩලය :-

සහතික කිරීමේ නිලධාරීන් වශයෙන් පහත දක්වෙන සුදුසුකම්වලින් යුත් පුද්ගලයින් ගරාජයේ සේවය සඳහා යොදවනු ලැබ සිටිය යුතුය.

(අ) මෝටර් වාහන ඉංජිනේරු විද්‍යා විෂය පිළිබඳව විශේෂ ප්‍රාගුණ්‍යයකින් යුතුව හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය ලබා මෝටර් වාහන ඉංජිනේරු ක්ෂේත්‍රයෙහි වර්ෂ පහක (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) මොරටුව ලංකා ජර්මානු තාක්ෂණික අභ්‍යාස ආයතනයේ මෝටර් යාන්ත්‍ර විද්‍යාව පිළිබඳව සිව් අවුරුදු පාඨමාලාව හදරා සමත්ව තිබීම හෝ වෙනත් සමාන සුදුසුකම් සහිතව මෝටර් වාහන ඉංජිනේරු ක්ෂේත්‍රයෙහි වර්ෂ අටක (08)ක පළපුරුද්දක් ලබා තිබීම.

2. අයදුම්පත සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය. :-

(අ) සහතික කිරීමේ නිලධාරින්ගේ සුදුසුකම් දක්වෙන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපතක්
(ආ) රු.1000/-ක ආපසු නොගෙවන තැන්පතු මුදලක් ලංකා බැංකුවේ 33965 ප්‍රවාහන කොමසාරිස්, මධ්‍යම පළාත, ගිණුමට බැර කරන ලද බැංකු රිසිට්පතක්
(ඇ) පරීක්ෂණ නිලධාරියාට ලඟාවිය හැකි පරිදි ගරාජය පිහිටා ඇති ස්ථානය නිශ්චිතව පෙන්නුම් කරන හා නගර මධ්‍යයේ සිට එම ස්ථානයට ලඟා විය හැකි මාර්ගය දක්වෙන දළ සිතියමක් (මාර්ග විස්තරය කෙටියෙන්)

අදළ අයදුම්පත් සතියේ වැඩ කරන දිනවල මෙම කාර්යාලයෙන් ලබා ගත හැක.

අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවර "යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා ගරාජ ලියාපදිංචි කිරීම 2023" යනුවෙන් සඳහන් කර ප්‍රවාහන කොමසාරිස්, ප්‍රවාහන දෙපාර්තමේන්තුව, අංක 104, යටිනුවර වීදිය,මහනුවර යන ලිපිනයට 2022 ඔක්තෝබර් මස 15 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ටී. එම්. පී. එස්. බී. තෙන්නකෝන්,
ප්‍රවාහන කොමසාරිස්,
ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
මධ්‍යම පළාත.

2022 සැප්තැම්බර් මස 12 වැනි දින,
මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 102,
යටිනුවර වීදිය, මහනුවර.

10-54

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| **ඔක්තෝබර්** | 2022.10.07 | සිකුරාදා | 2022.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.14 | සිකුරාදා | 2022.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.21 | සිකුරාදා | 2022.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.10.28 | සිකුරාදා | 2022.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2022.11.04 | සිකුරාදා | 2022.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.11 | සිකුරාදා | 2022.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.18 | සිකුරාදා | 2022.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.11.25 | සිකුරාදා | 2022.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2022.12.02 | සිකුරාදා | 2022.11.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.09 | සිකුරාදා | 2022.11.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.16 | සිකුරාදා | 2022.12.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.23 | සිකුරාදා | 2022.12.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.12.30 | සිකුරාදා | 2022.12.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.